# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2016

2022 මාර්තු/අප්‍රේල්

සමාජීයවිද්‍යා පීඨය

පුරාවිද්‍යාව - ARCH E 1025

පුරාවිද්‍යා මූලධර්ම හා විධි නියම/පුරාවිද්‍යාත්මක ක්‍රම සහ විධි

(2007-2011) පැරණි නිර්දේශයේ සිසුන් ප්‍රශ්න 05 කට ද (2012/13 -2016) නව නිර්දේශය සිසුන් ප්‍රශ්න 04 කට ද පිළිතුරු සැපයිය යුතුයි. (නව නිර්දේශය සිසුන් පැවරුමක් කළ යුතුය.)

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

1. පුරාවිද්‍යාව බහු විෂයයික අධ්‍යයන ක්ෂේත්‍රයක් ලෙස සලකන්නේ කුමන හේතු නිසාද? සාකච්ඡා කරන්න.

2. (අ) ස්ථානීය සකස්වීමේ ක්‍රියාවලිය යනු කුමක්ද?

   (ආ) විධිමත් ක්ෂේත්‍ර ගවේෂණයක දී දත්ත මගහැරයාම සිදුවිය හැකිද?

   (ඇ) අවධිමත් ක්ෂේත්‍ර ගවේෂණය පැහැදිලි කරන්න.

   (ඈ) ක්ෂේත්‍ර ගවේෂණ වාර්තාවක් වැදගත් වන්නේ කුමන හේතු නිසාද?

3. (අ) පුරාතනය පිළිබඳ නිවැරදි තොරතුරු අනාවරණය කිරීමේදී අදාළ විශේෂඥයින් පුරාවිද්‍යා කැණීමකදී කටයුතු කරන්නේ කෙසේද?

   (ආ) පුරාවිද්‍යා කැණීමකදී සංසිද්ධි අංක ලකුණු කරන්නේ ඇයි ?

   (ඇ) කැණීමකදී හමුවන පුරාකෘති හඳුනාගන්නේ කෙසේද?

   (ඈ) හැරිස් මෙට්රික්ස් ක්‍රමය පැහැදිලි කරන්න.

4. ගොඩනැගිලි හා ස්මාරක සංරක්ෂණයේදී අනුගමනය කරන සංරක්ෂණ ප්‍රභේද විස්තර කරන්න.

5. කෞතුකාගාර කළමනාකරණයේ දී සාර්ථක ප්‍රදර්ශනයක් සංවිධානය සඳහා අනුගමනය කලයුතු මූලධර්ම සාකච්ඡා කරන්න.

6. අනීතික පුරාවස්තු වෙළඳාම කුමක්ද යන්න හඳුන්වා දී එය වලක්වා ගැනීම සඳහා ඔබේ අදහස් හා යෝජනා ඉදිරිපත් කරන්න.

7. පැරණි ලංකාවේ වාණිජ සබඳතා හෙළිදරව් කරගැනීම සඳහා මෙරට ලැබී ඇති විදේශීය පිඟන් භාණ්ඩ කොතෙක් දුරට ඉවහල් වේද යන්න පිළිබඳව විමසීමක් කරන්න.

8. පහත සඳහන් මාතෘකා පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කරන්න.
   i. භූ භෞතික ගවේෂණය
   ii. සාපේක්ෂ කාලනිර්ණය
   iii. පුරාවස්තු සොරකම සහ විනාශයට අදාළ දඬුවම්
   iv. සුචිගතකිරීම